// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශේෂ

අංක 2254/44 - 2021 නොවැම්බර් මස 19 වැනි සිකුරාදා - 2021.11.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී 19/78 (V)

### 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත

13 වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, අධිකරණ අමාත්‍ය මොහොමඩ් අලි සබ්රි වන මා විසින්, මේ නියමය මගින් -

(අ) (i) 2017 සැප්තැම්බර් මස 25 වන දින අංක 2038/15 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනතේ 2 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ සාදනු ලැබූ නියමයේ නිශ්චිතව දක්වා ඇති හම්බන්තොට වරායේ ගොඩබිම් සහ ජල ප්‍රදේශ සීමාවන් ; සහ

(ii) 2019 ජූලි මස 22 වන දින අංක 2133/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනතේ 2 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ සාදන ලද නියමයේ නිශ්චිතව දක්වා ඇති මුහුදු ප්‍රදේශ සීමාවන්,

ඇතුළුව හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ දේශ සීමා සහ එහි දේශීය ජල තීරය තුළ අද්මිරාල්ති අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම සඳහා හම්බන්තොට අධිකරණ කලාපය සම්බන්ධයෙන් කටයුතු කරන මහාධිකරණ විනිසුරුවරයා වෙත බලය පවරනු ලැබේ ; සහ

(ආ) ඒ යටතේ කරන ලද කිසිවකට අගතියක් නොමැතිව, 2021 අගෝස්තු මස 6 වැනි දින අංක 2239/51 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද එකී පනතේ 13 වන වගන්තිය යටතේ සාදන ලද නියමය ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලැබේ.

එම්. යූ. එම්. අලි සබ්රි,
අධිකරණ අමාත්‍ය.

2021 නොවැම්බර් මස 05 වැනි දින,
කොළඹ දී ය.

12 - 20

1A - G 35395 — 60 (2021/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*